# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1800 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 04/12/2024<br>පැය 0600 |

# මාධ්‍ය නිවේදනය

## 01. කුෂ් මත්ද්‍රව්‍ය1සොයා ගැනීමක් - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ මහනුවර ඒකකය.

2024.12.03 වන දින රාත්‍රී කාලයේ වීරඹුගෙදර පොලිස් වසමේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ මහනුවර ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත උඩුමීය ප්‍රදේශයේ පිහිටි ගුවන් පාර්සල් ගෙන එනු ලබන ආයතනයක පාර්සල් පරීක්ෂා කිරීමේ අංශයේ සිදුකළ සෝදිසියකදී කැනඩා රටේ සිට මෙරටට ගෙන්වන ලද පාර්සලයක තිබී **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝ 02 ග්‍රෑම් 105 ක්** සොයා ගෙන වීරඹුගෙදර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශ මහනුවර ඒකකය සහ වීරඹුගෙදර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බොරැල්ල පොලිස් ස්ථානය.

2024.12.03 වන දින රාත්‍රී කාලයේ බොරැල්ල පොලිස් වසමේ ගොරකගහ පාර ප්‍රදේශයේදී බොරැල්ල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 132 මිලිග්‍රෑම් 320 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන කොළඹ 13 ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බොරැල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස පොලිස් ස්ථානය.

2024.12.03 වන දින රාත්‍රී කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ අත්තිඩිය ප්‍රදේශයේදී ගල්කිස්ස පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද

තොරතුරක් මත වැටලීමක් සිදුකර **කේරළ ගංජා කිලෝ 02 ග්‍රෑම් 205 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මාලිගාවත්ත පොලිස් ස්ථානය.**

2024.12.03 වන දින රාත්‍රී කාලයේ මාලිගාවත්ත පොලිස් වසමේ බෝධිරාජ මාවත ප්‍රදේශයේදී මාලිගාවත්ත පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 10 මිලිග්‍රෑම් 280 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන මාලිගාවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මාලිගාවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ජාඇල පොලිස් ස්ථානය.**

2024.12.03 වන දින රාත්‍රී කාලයේ ජාඇල පොලිස් වසමේ කොටුගොඩ ප්‍රදේශයේදී ජාඇල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 450 ක්** සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වන කොටුගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ජාඇල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. ද්විත්ව මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ සැකකරුවෙකු අත්අඩංගුවට - අහංගම පොලිස් සථානය.**

2024.10.04 වන දින අහංගම පොලිස් වසමේ වැල්හේන්ගොඩ ප්‍රදේශයේ නිවසක යුවලක් ගෙල කපා ඝාතනය කිරීම සම්බන්ධව අහංගම පොලිස් ස්ථානය විමර්ශන ආරම්භ කර තිබුණි. 2024.12.03 වන දින දහවල් කාලයේදී ඝාතනයට සම්බන්ධ සැකකරුවෙකු ගාල්ල කොටුව ප්‍රදේශයේදී අහංගම පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන උණවටුන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අහංගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**07.** **විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - කිරිඳිවැල පොලිස් වසම.**

2024.12.03 වන දින උදෑසන කාලයේ කිරිඳිවැල පොලිස් වසමේ කැන්දලන්ද ප්‍රදේශයේ කුකුළු ගොවිපලක සේවය කරනු ලබන පුද්ගලයෙකු විදුලි සැර වැදී වතුපිටිවල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇති බවට ලද පණිවිඩයක් මත කිරිඳිවැල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වන කැන්දලන්ද, බුලත්වැල්දෙනිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු කුකුළු ගොවිපල පවිත්‍ර කිරීමේදී ගොවිපලට අදින ලද විදුලි රැහැනකින් විදුලි සැර වැදීමෙන් මියගොස් ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. කිරිඳිවැල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**08.** **මාරක රිය අනතුරක් - දොඹගහවෙල පොලිස් වසම.**

2024.12.03 වන දින අළුයම් කාලයේ දොඹගහවෙල පොලිස් වසමේ මොණරාගල පොතුවිල් මාර්ගයේ ගලබැද්ද ප්‍රදේශයේදී අනාවරණය නොවූ වාහනයක මාර්ගයේ ගමන්කළ පදික පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පුද්ගලයා මොණරාගල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 40 ක් වූ ගලබැද්ද, මොණරාගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සිදුකළ වාහනය පලා ගොස් ඇති අතර, සැකකරු අත්අඩංගුවට ගැනීම සඳහා දොඹගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**09.** **මාරක රිය අනතුරක් - මහබාගේ පොලිස් වසම.**

2024.12.03 වන දින සවස් කාලයේ මහබාගේ පොලිස් වසමේ කොළඹ මීගමුව මාර්ගයේ වැලිසර ප්‍රදේශයේදී කොළඹ දෙස සිට මීගමුව දෙසට ධාවනය වූ ප්‍රයිමුවර් රථයක් නැවත කොළඹ දෙසට ධාවනය කිරීමට යූ හැඩයට හැරවීමට යාමේදී පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පාපැදිකරු රාගම රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 63 ක් වූ නවම්මහර, රාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සිදුකළ ප්‍රයිමුවර් රථ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. මහබාගේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**10.** **මාරක රිය අනතුරක් - පොල්ගහවෙල පොලිස් වසම.**

2024.12.03 වන දින උදෑසන කාලයේ පොල්ගහවෙල පොලිස් වසමේ යාංගල්මෝදර නාරම්මල මාර්ගයේ වඩුවාව ප්‍රදේශයේදී යාංගල්මෝදර දෙස සිට නාරම්මල දෙසට ගමන්කළ පාපැදියක් මාර්ගය අයිනේ සිටි පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික පුද්ගලයා පොල්ගහවෙල රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට මාරු කර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 82 ක් වූ වඩුවාව, යටිගල්ඔළුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අනතුර සම්බන්ධයෙන් පාපැදිකරු අත්අඩංගුවට ගෙන ඇත. පොල්ගහවෙල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**